# කොළඹ දිසා අධිකරණයේ දී ය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 21819/එම්.ආර්.

– එදිරිව –

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ 2 සහ අංක.37,
කිරුළ පෙදෙස, කොළඹ 5.

2. හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 1.

විත්තිකරුවන්.

විත්තිකරු, වෙනත් දේ අතර, නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් සිය රාජකාරී කටයුතු කරගෙන යන විට, ඔහු විසින් සුදු කරන්නට යෙදුනා වූ කටයුතුවලින් සහ/ හෝ කරන ලද ක්‍රියාවන්ගෙන් පැමිණිල්ලේ සඳහන් කර ඇති නඩු නිමිත්ත පැන නැඟ ඇති අතර, එකී කටයුතු සහ/ හෝ ක්‍රියාවන් චාරිතාගත කර සහ/හෝ ලේඛණගත කර, නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් විත්තිකරුගේ අධීක්ෂණය සහ/හෝ පාලනය සහ/හෝ ආධිපත්‍යය යටතේ මුදල් අමාත්‍යාංශය/මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන සහ තබාගෙන ඇති යොමු අංක ඒ/05/26 දරන ඇතැම් ලිපිගොනුවල ගොනු කර ඇති අතර, ඒ අනුව එකී ලිපිගොනු විත්තිකරුගේ සන්තකයේ හෝ බලය යටතේ තිබෙන හෙයින්,

එකී ලිපිගොනුවල ඇති ලියකියවිලි මෙම නඩුවට සම්බන්ධ ප්‍රස්තුත කාරණාවලට කෙළින්ම සම්බන්ධතාවයක් ඇති අතර, මෙම නඩුවේ විවාදයට භාජනය වන කාරණා පිළිබඳව එලදායී ලෙස සුදුස්සක් කිරීමට ඉතා මත් අවශ්‍ය වන හෙයින් ද,

ඉහත සඳහන් කරුණු අනුව, මෙම නඩුවේ ප්‍රස්තුත සියලු කාරණයන්ට අදාලව, විත්තිකරු සන්තකයෙහි හෝ බලය යටතේ ඉහත යොමු අංකය දරන ලිපිගොනුවල තිබෙන සියලු ලියකියවිලි දිව්රුම් ප්‍රකාශයකින් ප්‍රකාශයට පත් කරන ලෙස විත්තිකරුට නියම කරමින් ගරු අධිකරණය කාරුණිකව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වගන්තිය යටතේ නියෝගයක් කරන ලෙසට මම අයැද සිටිමි.

ගරු අධිකරණය කාරුණිකව, එම නියෝගය පිළිබඳ නොතිසිය "X" ලකුණු කර අමුණා ඇති ආකෘතිය අනුව 1 වන විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරුන් මගින් ඔහු වෙත භාර දීමට නියම කරන ලෙසත්, මම අයැද සිටිමි.

පැමිණිලිකරුගේ නීතිඥ මහතාට මෙම මෝසම සනාථ කිරීමට හැකි වන සේ ගරු අධිකරණය කාරුණිකව 1999 අප්‍රේල් මස 29 වැනි දින මෙම නඩුව කැඳවන ලෙස මම තවදුරටත් අයැද සිටිමි.

1999 අප්‍රියෙල් මස 28 වැනි දින.

පැමිණිලිකරුගේ නීතිඥ.

කොළඹ දිසා අධිකරණයේ දී ය. **"Y"**

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක. 167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

පැමිණිලිකරු.

නඩු අංකය: 21819/එම්.ආර්.

– එදිරිව –

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ 2 සහ අංක.37,
කිරුළ පෙදෙස, කොළඹ 5.

2. හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 1.

විත්තිකරුවන්.

ඉහත නම සඳහන් 1වන විත්තිකරු වෙතය,

(එම විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරුන් වන, කොළඹ 7, ග්‍රෙගරීස් පාරේ, අංක 59 හි පෝල් රත්නායක එසෝෂියේට්ස් මගින්, බාර කරවනු පිණිස ය.)

මෙම නඩුවේ ප්‍රස්තුත සියලු කාරණයන්ට අදාළ වන්නා වූ, මුදල් අමාත්‍යාංශය/මහා භාණ්ඩාගාරය මගින් පවත්වාගෙන යනු ලබන සහ තබාගෙන ඇති, ඒ අනුව නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් ඔබගේ අධීක්ෂණය සහ/හෝ පාලනය සහ/හෝ ආධිපත්‍යය යටතේ ඔබ සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන යොමු අංක ඊඑ/05/26 දරන ලිපිගොනුවල සියලු ලියකියවිලි, මෙම නොතිසිය ඔබ වෙත භාර දී දින 07ක් ඇතුළත දිවුරුම්පතක් මගින් ප්‍රකාශයට පත් කරන ලෙසට ඔබට මෙයින් නියෝග කරනු ලබන බව දැනුම් දෙනු ලැබේ.

1999ක් වූ අප්‍රියෙල් මස දින, කොළඹ දී ය. රෙජිස්ට්‍රාර්.

සකස් කරන ලද්දේ:

පැමිණිලිකරුගේ නීතිඥ.